## 1.1 හැඳින්වීම

විශ්ව නාට්‍ය කලාව කවදා කෙසේ ආරම්භ වී දැයි යන්න නිශ්චිතව ප්‍රකාශ කිරීමට හැකියාවක් නොමැත. විචාරකයන්ගෙන් මානව ශිෂ්ටාචාරය ආරම්භ වීමෙන් අනතුරුව භෞතික සුව විහරණය මෙන්ම ඉන් ඔබ්බට ගිය අධ්‍යාත්මික සුව විහරණය ද මනුෂ්‍යයාට අවශ්‍ය විය. මනුෂ්‍යත්වය සුන්දර කර ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස කලාව බිහිවූ අතර මිනිසා ඉතා ඉක්මනින් ඒ සඳහා යොමු විය. මානව ශිෂ්ටාචාරයේ වැඩීමත් සමගම සම අනුපාතය සුවපත් කර ගැනීම උදෙසා සෑම අවට ඇති ස්වභාවික වස්තූන් පිදීම ආරම්භ වූ අතර පසු කාලයක ශිෂ්ටාචාරයේ යම් තරමක දියුණුවක් සමග ඇති වූ පූජා කර්ම හා ශාන්ති කර්ම ආශ්‍රය කොට ගෙන ප්‍රාථමික කලාවක් බිහිවීමට මූලික අඩිතාලම වූ බව මානව විද්‍යාඥයෝ පිළිගන්නා කරුණකි. ඕනෑම රටක කලාව ඇතිවීමේ පාදම වී ඇත්තේ ඉහත සඳහන් කළ ආගමික හා පූජාර්ථ සංකල්පයන් මත බව ඉන් පෙන්නුම් කෙරේ.

ග්‍රීසියේ දියොනීසස් දේවාලයේ සිටි තෙස්පිස්ගෙන් ආරම්භ වූවායැයි සැලකෙන සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව වර්තමානයේ ලොව පවත්නා නාට්‍ය කලාවට මහා පිටුවහලක් වූවා යැයි සිතිය හැකිය. එය ඉහත සඳහන් කළ පූජා කර්මවලින් කලාව ඇතිවූවායැයි පවසින මතයට හොඳ උදාහරණයකි. දේශපාලන, සාමාජීය, සංස්කෘතික යන සෑම අංශයකින්ම පාහේ වර්ධනයක් ලබා සිටි ග්‍රීක පාලකයින් හා පාලිතයන් අතර සිදු වූ මහා රණ්ඩුසාව හේතුවෙන් ග්‍රීක නාට්‍ය කලාව එහි උපරිම තත්ත්වයට පත්විණි. ග්‍රීක නාට්‍ය කලාව පිරිහීමෙන් අනතුරුව රෝම නාට්‍ය කලාව නැගී ආ අතර එය ද සැලකිය යුතු ප්‍රමාණයකින් දියුණුවට පත්විය. නමුත් විද්වතුන් සලකන්නේ මෙය ග්‍රීක නාට්‍ය කලාවේම තාවත් කොටසක් ලෙසයි. රෝම නාට්‍ය කලාව, ග්‍රීක නාට්‍ය හා සම්මිශ්‍රණයක්ව ඉදිරියට ගියේය. පසුව රෝමානු කතෝලික ආගම හේතුවෙන් අභාවට ගිය නාට්‍ය කලාව පසුව ඒ තුළින්ම යළිත් මතු වී ව්‍යාප්ත විය. එම යුගය ලොව අඳුරු යුගය හෙවත් පුනරුද යුගය ලෙස හැඳින්වේ. මධ්‍ය කාලීන නාට්‍ය කලාව එට ම විශේෂ වූ දේශපාලනමය හා සංස්කෘතික පසුබිමක් පදනම් කොට ගනී. ඉන් අනතුරුව මහා කවියෙකු හා නාට්‍යකරුවෙකු වූ විලියම් ශේක්ස්පියර් යුගයේ ඇති වූ එළිසබෙතානු නාට්‍ය කලාව මහා රාජ්‍ය අනුග්‍රහයක් යටතේ එහි දියුණුවේ හිණිපෙත්තටම ළඟා වූ අයුරු එම නිර්මාණ ඇසුරු කිරීමේදී අපට අවබෝධ කරගත හැකිය. එළිසබෙතානු යුගයේ අවසානයත් සමග ආරම්භ වන නොර්වීජියානු ජාතික හෙන්රික් ඉබ්සන් ප්‍රමුඛ නූතන නාට්‍ය කලාව අධිරාජ්‍යවාදයට හා ධනවාදයට එරෙහිව යන්නට උත්සාහ දැරූ නාට්‍ය කලාවක් බව පෙනේ. එය යුරෝපීය නාට්‍ය කලාව ලෙස ද හඳුන්වනු ලබයි.

මෙම ඇසිඩු නාට්‍ය කලාවේ ප්‍රගමනයට හේතු වූ එක් ප්‍රධාන සාධකයක් ලෙස සිත්තර රාමු වේදිකාව (Procinium Stage) හැඳින්විය හැක. එතෙක් තිබූ නාට්‍ය වේදිකාවන්ගෙන් දුරස්ව හා ඊට සම්පූර්ණයෙන්ම වෙනස්ව මෙම වේදිකාව ඇති විය. එය නාට්‍ය කලාව නව ආරකට යොමු කිරීමට හේතු විය.

නාට්‍ය කලාව පිළිබඳව 19 වැනි සියවසේ විසූ සුප්‍රකට ජර්මන් ජාතික ඔගස්ට් විලියම් පුළුල් නිර්වචන ගණනාවක් සපයා ඇත. නාට්‍ය කලාවේ ප්‍රබලත්වය, ශක්‍යතා, විශේෂතා හා සීමාවන් පිළිබඳව ඒවා ඉතා වැදගත් වේ.

01. රංග කලාව වනාහී (The Theatre) කිසියම් ඉන්ද්‍රජාලික සංකල්පනයක් ඇති කිරීම පිණිස කලා මාධ්‍ය රැසක සංකලනයෙන් ද,
02. වාක් චාතුර්යය සහ පෙළෙහි ඇති සුවිශේෂී වූ කාව්‍යමය අර්ථකථනය කිරීමට ඉඩ සැලැස්වීමෙන් ද,
03. ගෘහ නිර්මාණ ශිල්පයෙහි පවතින ශ්‍රේෂ්ඨ අංගෝපාංගයන් උපයෝගී කර ගනිමින් ද,
04. දෘශ්‍යමය මායාවේ පර්යාවලෝකනයක් පුළුල් කරගන්නා වූ ද,
05. සංගීතයේ ආධාරයෙන් ප්‍රේක්ෂක සිත නාට්‍යයේ අත්දැකීම් සුසර (Tune) කිරීමෙන් එසේ නැතහොත් නාට්‍ය තුළින් මතුවන රසභාවයන් තව දුරටත් තීව්‍ර කිරීමෙන් ද,
06. ශතවර්ෂයක කාලයක් සිස්සේ වැවෙමින් ආ ජාතියක් සතුවන සාමාජීක හා කලාත්මක ඥානයේ අනුඵලයන් කෙටි වූ පැය ගණනක් තුළට කැටි කරමින් සෑම වයසකටම හා තරාතිරමකටම අයත් ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට සුවිශේෂී රසයක් ලබා දෙන්නා වූ,
07. රසඥතාව වර්ධනය කරගත් ජනතාවගේ ලෙංගතු මාධ්‍යය වේ.

ලෝක නාට්‍ය ඉතිහාසයෙන් බැහැරව ලාංකේය නාට්‍ය ඉතිහාසය පිළිබඳව මදක් කරුණු විමසීමේදී ද පැහැදිලිවෙන්ම සඳහන් කළ කරුණු සත්‍ය බව සනාථ වේ. එනම් ලාංකේය නාට්‍ය කලාව ද ආරම්භ වූයේ පූජාවිධිය මුල් කරගෙනය. ගැමි නාටක, සොකරි, කෝලම්, නාඩගම් වලින් අනතුරුව නූර්තියේ ආගමනයත් සමග ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවට නව මුහුණුවරක් ලැබේ. එම සාධකයත් සමග එකල තිබූ ගැමි නාට්‍ය සම්ප්‍රදාය යටපත්ව නව නාට්‍ය ප්‍රේක්ෂකයා අතර ජනප්‍රිය විය. 1956 මනමේ වේදිකා ගත වීමත් සමග ආරම්භ වූවායැයි සැලකෙන ශ්‍රී ලාංකේය නාට්‍ය කලාව වර්තමානයේ වර්ධනාත්මක තත්ත්වයක දක්නට ලැබේ.

පින්තූර රාමු වේදිකාව නාට්‍ය කලාවට එක්වීමෙන් අනතුරුව ඒ හා සම්බන්ධ අනුශාංගික කලාවන් රාශියක් ඇති විය. ඒ එක් අංශයක් ලෙස වේදිකා පරිපාලනය (Stage Managment) හැඳින්විය හැකිය. වේදිකා පාලනය නාට්‍ය කලාව ආරම්භයේ සිටම අක්‍රමවත්ව දක්නට ලැබුනු අතර එය වෘත්තියක් ලෙස ආරම්භ වනුයේ මේ කාල වකවානුවේදීය. එම කාර්යය කරවනු ලබන පුද්ගලයා වේදිකා පරිපාලකවරයා (Stage Manager) ලෙසත් හඳුන්වනු ලබයි. නාට්‍යයක ආරම්භයේ සිට අවසානය දක්වාමත් නාට්‍ය රංග ගතවීමේ දී හා ඉන් පසුවටත් අතිමහත් වූ වගකීම් සහිත කර්තව්‍යයක් ඉටු කරන පුද්ගලයෙකු ලෙස මොහු හැඳින්විය හැකිය. ඔහු නාට්‍යයක සාර්ථකත්වය උදෙසා බලපානු ලබන පුද්ගලයෙකි. නමුත් ලෝකයේ වෙනත් රටවල වේදිකා පරිපාලකවරු සහ ලංකාවේ වේදිකා පරිපාලකවරයා අතර වෙනස්කම් දක්නට ලැබේ. ලාංකේය ගැමි නාට්‍ය කලාවෙන් ලැබුණු ආභාෂය හා බලපෑම ඊට හේතු වන්නට ඇතැයි කිව හැකිය.

ලාංකේය වේදිකා නාට්‍යයට වේදිකා පරිපාලකවරයාගේ ඇති දායකත්වයේ සාර්ථකභාවය පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක යෙදීමට මෙයින් අදහස් කෙරේ. එසේම වේදිකා පරිපාලකවරයාගේ කාර්යභාරය හඳුනා ගැනීම, ලෝක වේදිකාව තුළ එම දායකත්වයේ වෙනස පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ලාංකේය වේදිකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සහ ලෝක වේදිකාවේ වේදිකා පරිපාලකවරයාගේ දායකත්වය සහ ලාංකේය වේදිකා පරිපාලකවරයාගේ දායකත්වයේ වෙනස පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමට ද මේ මගින් හැකිවනු ඇත.

අන් සියලු කලාංගයන් අතුරින් බහුජන සහභාගීත්වයක් සහිත වඩාත් ජනප්‍රිය කලාවක් ලෙස නාට්‍ය කලාව හැඳින්විය හැකිය. නමුත් සිංහල නාට්‍ය පෝෂණය කිරීමෙහිලා ඉවහල් වන පොහොසත් නාට්‍ය සාහිත්‍යයක් අපට නැත. විශ්වමය අගයන් ඇති නාට්‍ය කෘතීන් සිංහල භාෂාවෙන් පරිශීලනය කිරීමට ඇති අවස්ථා ඉතා සීමා සහිතය. මේවා සිංහල භාෂාවට පරිවර්තනය වී ඇත්තේ කොතරම් අතළොස්සක්ද? නාට්‍ය අධ්‍යයනය, රඟපෑම, වේදිකා පරිපාලනය, වෙස් ගැන්වීම, ආලෝක පරිහරණය වැනි අනුශාංගික අංගයන් පිළිබඳව සිංහලෙන් අවබෝධයක් ලබාගත හැකි මූලාශ්‍රයන් ඇත්තේ කොතරම් අල්ප ප්‍රමාණයක්ද?

එවැනි හේතු නිසාවෙන් මෙම පර්යේෂණය ඉදිරියට නාට්‍ය හා රංග කලාව හදාරන විද්‍යාර්ථීන්ටත් වේදිකාවට ඇළුම් කරන ඒ පිළිබඳව දැනගැනීමට ආශා කරන කවරෙකුට හෝ වැදගත් වේ යැයි සිතන අතර නාට්‍ය හා රංග කලාව හදාරන විද්‍යාර්ථියෙක් වශයෙන් මාගේ ඉදිරි අධ්‍යයන කටයුතු සාර්ථක කරන සවිමත් පදනමක් ලෙස මෙම පර්යේෂණ නිබන්ධය මූලාරම්භයක් බවට පත්කර ගැනීමට ද මම බලාපොරොත්තු වෙමි.